# සාර සංග්‍රහය

ග්‍රීක නාට්‍ය කලාවේ මූලාරම්භය දියෝනීසස් දේව වන්දනය හා බැඳී පැවතුණි. පසු කාලීනව වඩා සංවිධානාත්මක ස්වරූපයක් දරූ එය නාට්‍ය උත්සවයක් බවට පත් විය. එහි දී රඟ දක්වූ ට්‍රැජඩි, කොමඩි, සැටර් නාට්‍ය ප්‍රභේද තුන අතුරින් ට්‍රැජඩියට හිමි වූයේ සුවිශේෂ ස්ථානයකි. ඊස්කිලස්, සොෆොක්ලීස් හා යුරිපිඩීස් සම්භාව්‍ය යුගයේ ජීවත් වූ අග්‍රගණ්‍ය ට්‍රැජඩි නාට්‍ය රචක ත්‍රිමූර්තිය විය. ඔවුන්ගේ නාට්‍ය නිර්මාණයන්හි කාන්තා චරිත සඳහා හිමිවූයේ ප්‍රමුඛ ස්ථානයකි.

අතීතයේ මාතෘ මූලික සමාජයක් වූ ග්‍රීක සංස්කෘතිය උතුරින් එල්ල වූ ආක්‍රමණ සමග ක්‍රමයෙන් පීතෘ මූලික සමාජයකට පරිවර්තනය විය. ග්‍රීක සම්භාව්‍ය යුගය වන විට කාන්තාව පුරුෂාධිපත්‍යයට යටත් ව පීඩිත ව ජීවත් වී ඇත. දරුවන් වැදීම, ගෘහ කටයුතු පාලනය ආදී කාර්යයන් කිහිපයක් පමණක් ඇයට පැවරී තිබුණි. දේශපාලන, ආර්ථික, සමාජීය වශයෙන් මෙන් ම නිදහස් චින්තනයේ අයිතිය ද ඇයට නො වීය.

ඉහත ට්‍රැජඩි නාට්‍යකරුවන් පුරාකතා ඇසුරෙන් නාට්‍ය රචනා කළ අතර සමාජගත කාන්තාව හා සසඳන කළ ඔවුන්ගේ චරිත නිර්මාණයන් වඩාත් ප්‍රබල විය. ඔවුන් කරළියට ගෙන ආවේ ක්ලිටමෙනස්ට්‍රා, යොකොස්ටා, ඇන්ටිගනි, පොළෝ ගැබින් පැමිණි දූතියන්, මීඩියා, ෆීඩ්‍රා ආදී විප්ලවකාරී  කාන්තා චරිතයන්ය. ඔවුන් රාජ්‍ය පාලනය කළ, තනිව තීරණ ගත්, දේශපාලන අයිතිය හෙබි, පවුල තුළ ගෞරවයට පත්, උපක්‍රමශීලී, ආවේගශීලී, නොපසුබට අධිෂ්ඨානයෙන් යුතු, අභ්‍යන්තර මානසික හැඟීම් වෙනුවෙන් අරගල කළ චරිත විය. ඇතමෙක් කෲර පළිගැනීම් පවා සිදු කර ඇත. ඔවුන් සමාජ සම්මතය තුළ මුළු ගැන්වී සිටින සම්ප්‍රදායික කාන්තා භූමිකාවෙන් වෙනස් වී ඇත.

ග්‍රීක සම්භාව්‍ය යුගයේ දැනට ශේෂ ව ඇති ඊස්කිලස්, සොෆොක්ලීස්, යුරිපිඩීස් යන ට්‍රැජඩි නාට්‍යකරුවන් තිදෙනාගේ තෝරාගත් නාට්‍ය කෘතීන්හි කාන්තා චරිත ඉදිරිපත් කර ඇති ආකාරය මෙහි දී අධ්‍යයනය කෙරේ. විවිධ පැතිකඩ ඔස්සේ එම කාන්තා චරිත ගොඩ නැගීමට තත්කාලීන ග්‍රීක සමාජ, දේශපාලන හර පද්ධති හා දාර්ශනික දෘෂ්ටිය ඔවුන්ට බලපා ඇති ආකාරය අධ්‍යයනය මෙම පර්යේෂණයේ අරමුණයි. ඒ තුළින් නිර්මාණකරුවකු විසින් ඔහුගේ පරිකල්පනය මෙහෙයවා කරනු ලබන නිර්මාණය සමග යථාර්ථය පවත්වන්නා වූ අන්තර් සම්බන්ධතාවය විමසීමට ලක් කළ හැකි ය.

ග්‍රීක ට්‍රැජඩි නාට්‍ය කලාව නව මානයන්, ආකෘතීන් හා ප්‍රවනතාවයන් ඔස්සේ ලාංකීය ජන වේදිකාව මත අත්හදා බැලීම් සිදු කරනු ලබයි. එහි දී සම්භාව්‍ය නාට්‍ය කෘතීන් හි කාන්තා චරිත පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කිරීමට සහ නව අර්ථකථන ගොඩනැගීම උදෙසා මෙම පර්යේෂණය වඩාත් ප්‍රතිඵලදායක විය හැකි ය.



**ප්‍රමුඛ පද** - කාන්තාව , පුරුෂාධිපත්‍යය , ට්‍රැජඩි , සමාජ දෘෂ්ටිය , නාට්‍යකරුවා

# Abstract

The origin of Greek drama was liked with the worship of God Dionysius the god of fertility after life and wine. The ritual which later turned in to a religious ceremony came to be organized as a dramatic festival later on. Three types of drama were performed in these festivals. They were Tragedy, Comedy and satire. Among three Tragedies took a prominent place. Among the classical dramatists who lived in $5^{th}$ century BCE only the plays of Aeschylus, Sophocles and Euripides have survived the test of time. Characters of women have obtained a prominent place in their dramas.

The Matriarchal society which existed Greece had turned in to a patriarchal society. By the classical period women had become subordinate to their made counter parts. She had only the powers of giving birth and nurturing children apart from some other insignificant functions. Political, social, economical rights as well as freedom of thought had not been accessible to women.

The afore mentioned dramatists, though they based their themes on ancient myths the portrayal of women were given much strength. They brought on to stage characters such as Clytemnestra, Jocasta, Antigoni, furies, Medea, Phaedra. These characters indulged in ruling the state, were independent in thought had political rights and were well respected within the family. They were also tactful, passionate and obstinate characters who stood up for internal conflicts within their minds. Some had even resort to take cruel revenge. They were very much different from the traditional subdued women.

This study would be concentrated on selected characters of women found in the tragedies of the Classical period. The aim and objective of the investigation would be to analyze the various factors that had influenced the characters to be so. The reasons would be of the values of contemporary society, politics and philosophical thought that were likely to have influenced them. With those would be compared the forces that would have affected the thoughts of the dramatist with reality that they were facing.

Sri Lankan dramatists have been of late compelled to experiment on Greek Tragedy through various interpretations and structures based on vivid angles. This study could make a considerable contribution to the afore mentioned translations and adaptations of this new tendency in Sri Lanka.


**Key words –** woman, male dominance, tragedy, social vision, dramatist